# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2308/50 - 2022 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2022.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව විසින් 2022.11.17 වැනි දින පහත සඳහන් තීරණය සම්මත කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**තියාගරාජා නිරෝස්,**
සභාපති,
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 17 වැනි දින,
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව,
පුත්තූර්.

**2022.11.17 වැනි දින අංක 03 දරන තීරණය**

1989 අංක 12 දරන පළාත්සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සකස් කරනු ලැබූ 2018.05.09 වැනි දින අංක 2070/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ උතුරු පළාත් සභාව විසින් 2018.09.11 වැනි දින ස්ථිර කරන ලද 2018.10.08 වැනි දින අංක 2092/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූ අධිකාරය 07 සිට 09 දක්වා වූ උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා අතුරු ව්‍යවස්ථා පිළිගන්නා බවත් 2023.01.01 වැනි සිට වලිකාමම් නැගෙනහිර ප්‍රදේශයේ ඒවා ක්‍රියාත්මක කරන බවත් ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

EOG 12 - 0051